# ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය
# அனர்த்த முகாமைத்துவ நிலையம்
# DISASTER MANAGEMENT CENTRE

අංක 120/2,
විද්‍යා මාවත,
කොළඹ 07

எண் 120/2
வித்யா மாவத்தை
கொழும்பு 07

No 120/2,
Vidya Mawatha,
Colombo 07


ඔබේ අංකය / உமது இல / Your No. }

මගේ අංකය / எனது இல } DMC/08/Weather Forecast

දිනය / திகதி } 2026.04.21

යුද්ධ හමුදාධිපති,

ගුවන් හමුදාපති,

නාවික හමුදාධිපති,

පොලිස්පති,

අධ්‍යක්ෂ ජනරාල්, සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව,

සියලුම දිස්ත්‍රික් නියෝජ්‍ය / සහකාර අධ්‍යක්ෂවරුන්,

**<u>ප්‍රබල අකුණු පිළිබඳව අවවාදාත්මක නිවේදනයයි.</u>**

2026.04.21 වන දින 1200 පැයට කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද ප්‍රබල අකුණු පිළිබඳව අවවාදාත්මක නිවේදනය හා බැදේ.

02. එබැවින් සිදුවිය හැකි ආපදා තත්ත්වයන් අවම කිරිමට / පාලනය කර ගැනිමට හා කළමනාකරණය කර ගැනිම සඳහා මෙම නිවේදනය අනුව කටයුතු කරන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

03. තවද එම දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරනු ලබන නිවේදන පිළිබඳව විමසිලිමත්ව කටයුතු කරන මෙන් ද මෙම නිවේදන පිළිබඳ විස්තර ලබා ගැනිම සඳහා 117 දුරකථන අංකය අමතන ලෙසටද වැඩිදුර තාක්ෂණික උපදෙස් ලබා ගැනිම සඳහා **<u>කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව</u>** සමඟ සම්බන්ධිකරණය වන ලෙසටද කාරුණිකව ඉල්ලා සිටිමි.



එච්.ඩී.ජී. ප්‍රියන්ත
නියෝජ්‍ය අධ්‍යක්ෂ
රාජකාරි භාර නිළධාරී
අධ්‍යක්ෂ ජනරාල් වෙනුවට

**කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව**
**வளிமண்டலவியல் திணைக்களம்**
**Department of Meteorology**

TP : 011 2686686
Fax : 011 2691443
E-mail : metnmc@gmail.com
Web : www.meteo.gov.lk

නිවේදන අංකය : 01 LLA/26/04/21/01
වර්ණය : ඇම්බර්

## ප්‍රබල අකුණු පිළිබඳව අවවාදාත්මක නිවේදනය

කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ, ස්වභාවික විපත් පිළිබඳ පූර්ව අනතුරු ඇඟවීමේ මධ්‍යස්ථානය විසින්
2026 අප්‍රේල් මස 21 දින රාත්‍රී 11.30 දක්වා වලංගු වන පරිදි
2026 අප්‍රේල් මස 21 දින මධ්‍යහන 12.00 ට නිකුත් කරන ලදී.

### බස්නාහිර, සබරගමුව, මධ්‍යම, වයඹ, උතුරුමැද, දකුණ, ඌව පළාත් සහ මන්නාරම, වවුනියාව, අම්පාර, මඩකලපුව දිස්ත්‍රික්ක සඳහා




### සැලකිලිමත් වන්න!

බස්නාහිර, සබරගමුව, මධ්‍යම, වයඹ, උතුරුමැද, දකුණ, ඌව පළාත්වල සහ මන්නාරම, වවුනියාව, අම්පාර, මඩකලපුව දිස්ත්‍රික්කවල සවස 1.00 න් පමණ පසුව ගිගුරුම් සහිත වැසි සමග ප්‍රබල අකුණු ඇතිවීමේ ඉහළ හැකියාවක් පවතී.

ගිගුරුම් සහිත වැසි සමඟ එම ප්‍රදේශවල තාවකාලිකව තද සුළං ඇති විය හැක. අකුණු මඟින් සිදුවන අනතුරු අවම කර ගැනීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස ජනතාවගෙන් කාරුණිකව ඉල්ලා සිටිනු ලැබේ.

### ආරක්ෂිත පියවර:

අකුණු සහ ගිගුරුම් පවතින අවස්ථාවල පහත ආරක්ෂිත පියවරයන් අනුගමනය කරන මෙන් කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව මහජනතාවට අවවාද කෙරේ.

- එළිමහනේ හෝ ගස් යට නොසිටිය යුතු අතර ආරක්ෂිත ගොඩනැගිල්ලක් හෝ සංවෘත වාහනයක් තුළ රැඳී සිටින්න.
- කුඹුරු, තේ වතු, ක්‍රීඩා පිටි මෙන්ම ජලාශ වැනි විවෘත ස්ථාන වල රැඳී සිටීමෙන් වලකින්න.
- රැහැන් සහිත දුරකථන සහ විදුලියට සම්බන්ධ කරන ලද විදුලි උපකරණ භාවිතයෙන් වලකින්න.
- බයිසිකල්, ට්‍රැක්ටර් සහ බෝට්ටු වැනි විවෘත වාහන භාවිතයෙන් වලකින්න.
- තද සුළං හේතුවෙන් ගස් හා විදුලි රැහැන් බිම ඇද වැටීමට ඉඩ ඇති බැවින් ඒ පිළිබඳව සැලකිලිමත් වන්න.
- හදිසි තත්වයකදී ප්‍රාදේශීය ආපදා කළමනාකරණ නිලධාරීන් ගේ සහය පතන්න.

| වර්ණය: -රතු<br>අනතුරු ඇඟවීම (පියවර ගන්න) | වර්ණය: -ඇම්බර්<br>අවවාදාත්මක (සූදානම් වන්න) | වර්ණය: -කොළ<br>(බලපෑමක් නැත) |
|---|---|---|

Spatial rainfall distribution: Isolated: <25%, A few: 26-50%, Many: 51-75%, Most: 76-100%
Rainfall amount (mm): Fairly Heavy rain: 50 -100, Heavy rain: 100 – 150, Very heavy rain: 150 or more.